72, පාර්ක් වීදිය, කොළඹ-2, ශ්‍රී ලංකාව
දු.ක: +94 11 231 4041/2/3/5 ෆැක්ස්: +94 11 231 4040
විද්‍යුත් තැපැල: info@ihp.lk වෙබ: www.ihp.lk ට්විටර්: @ihplk

IHP
INSTITUTE FOR HEALTH POLICY

# මාධ්‍ය ප්‍රකාශය

**නිකුත් කිරීම**

දිනය: 2023 ඔක්තෝම්බර් 16
වේලාව: ශ්‍රී ලංකා වේලාවෙන් ප.ව 12.00

**වැඩිදුර තොරතුරු සඳහා සම්බන්ධ කර ගැනීමට**

ඩැල්රීන් බාත්ලට්
විද්‍යුත් තැපැල: dalreen `at' ihp.lk


**ප්‍රධාන විමර්ශකයා සම්බන්ධ කර ගැනීමට**

ආචාර්ය රවී රන්නන්-එලිය
විද්‍යුත් තැපැල: ravi `at' ihp.lk ට්විටර්: @ravirannaneliya

## ශ්‍රී ලංකා පාරිභෝගික විශ්වාසය: සැප්තැම්බර් මාසයේදී පාරිභෝගික *විශ්වාසය* තවදුරටත් නොවෙනස්ව පවතින නමුත් අශුභවාදී මට්ටම්වලම පවතී

*දිගු කාලීන අනාගතය පිළිබඳ අඩු සුබවාදී බලාපොරොත්තුවක් පවතින නමුත් සමස්ත විශ්වාසය එම මට්ටමේම නොවෙනස්ව පවතී*

සෞඛ්‍ය ප්‍රතිපත්ති ආයතනය (IHP) විසින් ශ්‍රී ලංකා මත විමසුම් සමීක්ෂණයෙන් (SLOTS) නිර්ණය කරන ලද පාරිභෝගික විශ්වාසනීය දර්ශකවල 2023 සැප්තැම්බර් මස යාවත්කාලීන කිරීම අද නිකුත් කළේය.



IHP SLOTS සැප්තැම්බර් මස මත විමසුම් සමීක්ෂණයට අනුව සමස්ත පාරිභෝගික විශ්වාසයේ සුළු වෙනසක් සිදුව ඇත. පාරිභෝගික හැඟීම් පිළිබඳ දර්ශකය (ICS), මහජනතාවගේ පුද්ගලික ආර්ථික තත්ත්වය සහ ජාතික ආර්ථික තත්ත්වය පිළිඹිබු කරන පුළුල් මිනුමක් වන අතර එය 2023 සැප්තැම්බර් මාසයේදී, දෝෂ ආන්තිකය තුළ ලකුණු 1 කින් අඩු වී 25 දක්වා ලඟා වී ඇත. ICS ශුන්‍යයේ සිට උපරිමය 100 දක්වා පරාසයක පවතින අතර, ශුද්ධ අශුභවාදී මට්ටම 50ට අඩු අගයන් මඟින් පෙන්නුම් කරයි.

දිගු කාලීන අනාගතය පිළිබඳ අඩු සුබවාදී බලාපොරොත්තුවක් නොවෙනස්ව ඉදිරියට පෙන්නුම් කරන නමුත් වර්තමානය පිළිබඳවත් ධනාත්මක මතයක් නොදරන බව දත්ත පෙන්වා දෙයි. අනාගතය පිළිබඳ විශ්ලේෂණය කරනු ලබන මිනුමක් වන පාරිභෝගික අපේක්ෂාවන් පිළිබඳ දර්ශකය (ICE), ලකුණු 2 කින් අඩුවී 30 දක්වා ලඟා වී ඇත. වත්මන් තත්ත්ව පිළිබඳ (ICC) දර්ශකය 18 වන අතර එය බොහෝ දුරට නොවෙනස්ව පැවතුනි (+1).

2023 සැප්තැම්බර් මාසයේදී පවත්වන ලද සම්මුඛ පරීක්ෂණ 588ක් සහ 2021 ඔක්තෝබර් 21 සිට 2023 සැප්තැම්බර් 30 දක්වා වැඩිහිටියන්ට පවත්වන ලද සමීක්ෂණ 12,658ක් මත CCI ඇස්තමේන්තු පදනම් වී ඇති අතර එක් එක් දර්ශකයෙහි ප්‍රතිචාරයන්හි අනුපාත අනුව නියැදි ප්‍රමාණ වෙනස් වේ.

**පසුගිය මාසයේ IHP පාරිභෝගික මිනුම්හි වෙනස්වීම්**

| මිනුම | ↓↑↔ | 2023 සැප්තැම්බර් | 2023 අගෝස්තු | 2023 ජුලි | 2023 ජූනි | 2023 මැයි | 2023 අප්‍රේල් | 2023 මාර්තු | 2023 පෙබරවාරි |
|---|---|---|---|---|---|---|---|---|---|
| පාරිභෝගික හැඟීම් දර්ශකය (ICS) | ↓ 1 | **25** | **26** | 30 | 24 | 25 | 26 | 17 | 12 |
| පාරිභෝගික අපේක්ෂාව පිළිබඳ දර්ශකය (ICE) | ↓ 2 | **30** | **32** | 37 | 31 | 33 | 35 | 22 | 17 |
| වත්මන් තත්ත්වයන් පිළිබඳ දර්ශකය (ICC) | ↑ 1 | **18** | **17** | 20 | 13 | 12 | 13 | 9 | 6 |
| පුද්ගලික මූල්‍ය තත්ත්වය (පසුගිය මාස 12) | ↔0 | **20** | **20** | 19 | 15 | 16 | 15 | 11 | 5 |
| පුද්ගලික මූල්‍ය තත්ත්වය (ඉදිරි මාස 12) | ↓ 1 | **33** | **34** | 42 | 31 | 28 | 35 | 23 | 20 |
| රටේ තත්ත්වය (ඉදිරි මාස 12) | ↑ 3 | **26** | **23** | 25 | 28 | 30 | 27 | 18 | 12 |
| රටේ දිගු කාලීන අපේක්ෂාවන් (ඉදිරි වසර 5) | ↓ 7 | **31** | **38** | 44 | 34 | 40 | 43 | 26 | 19 |
| වත්මන් මිලදී ගැනීමේ තත්ත්වය | ↑ 1 | **15** | **14** | 20 | 11 | 8 | 10 | 6 | 6 |

**සෞඛ්‍ය ප්‍රතිපත්ති ආයතනය, ශ්‍රී ලංකා මත විමසුම් සමීක්ෂණය**

SLOTS විසින් 2023 පෙබරවාරි 01 සිට 2023 සැප්තැම්බර් 30 දක්වා පවත්වන ලද සම්මුඛ පරීක්ෂණ 4,219 මත පදනම් ව ඇස්තමේන්තු සකස් කර ඇත. ස්ත්‍රී පුරුෂ භාවය, වයස, වාර්ගිකත්වය, අධ්‍යාපනය, අංශය, පළාත සහ සමාජ ආර්ථික තත්ත්වය භාවිතයෙන් ජාතික ජනගහනයට ගැළපෙන පරිදි මාසික ඇස්තමේන්තු නැවත සකස් කර ඇත.

**සම්පූර්ණ වාර්තාව ihp.lk යෙන් ලබා ගත හැකිය**

සෞඛ්‍ය ප්‍රතිපත්ති ආයතනය, 2023 ඔක්තෝම්බර්, “ශ්‍රී ලංකා පාරිභෝගික විශ්වාසය: සැප්තැම්බර් මාසයේදී පාරිභෝගික විශ්වාසය තවදුරටත් නොවෙනස්ව පවතින නමුත් අශුභවාදී මට්ටම්වලම පවතී”, SLOTS වාර්තාව #2023-15. http://ihp.lk/publications/docs/SLOTSReport202315.pdf යෙන් ලබා ගත හැකිය.

**පෙර වාර්තාවන් ihp.lk වෙතින් ලබා ගත හැකිය**

සෞඛ්‍ය ප්‍රතිපත්ති ආයතනය, 2023 සැප්තැම්බර්, “ශ්‍රී ලංකා පාරිභෝගික විශ්වාසය:අගෝස්තු මාසයේදී පාරිභෝගික විශ්වාසය මද වශයෙන් පහත වැටෙන නමුත් පැහැදිලි වෙනසක් නොමැත.”, SLOTS වාර්තාව #2023-14. http://ihp.lk/publications/docs/SLOTSReport202314.pdf යෙන් ලබා ගත හැකිය.

සෞඛ්‍ය ප්‍රතිපත්ති ආයතනය, 2023 අගෝස්තු, “ශ්‍රී ලංකා පාරිභෝගික විශ්වාසය:ජූලි මාසයේදී පාරිභෝගික විශ්වාසය සැලකිය යුතු ලෙස වැඩි වුවද, තවමත් අශුභවාදී මට්ටම්වලම පවතී.”, SLOTS වාර්තාව #2023-13. http://ihp.lk/publications/docs/SLOTSReport202313.pdf යෙන් ලබා ගත හැකිය.

සෞඛ්‍ය ප්‍රතිපත්ති ආයතනය, 2023 ජූලි, “ශ්‍රී ලංකා පාරිභෝගික විශ්වාසය:ජූනි මාසයේදී පාරිභෝගික විශ්වාසය සුළු වශයෙන් වෙනස් වුවද, තවමත් අශුභවාදී මට්ටම්වලම පවතී.”, SLOTS වාර්තාව #2023-12. http://ihp.lk/publications/docs/SLOTSReport202312.pdf යෙන් ලබා ගත හැකිය.

සෞඛ්‍ය ප්‍රතිපත්ති ආයතනය, 2023 ජූනි, “ශ්‍රී ලංකා පාරිභෝගික විශ්වාසය: අප්‍රේල් මසදී පාරිභෝගික විශ්වාසය ඉහළ මට්ටමට ළඟා වීමෙන් පසුව මැයි මාසයේදී සුළු වශයෙන් වෙනස් වී ඇත”, SLOTS වාර්තාව #2023-11. http://ihp.lk/publications/docs/SLOTSReport202311.pdf යෙන් ලබා ගත හැක.

සෞඛ්‍ය ප්‍රතිපත්ති ආයතනය, 2022 මාර්තු, “SLOTS පාරිභෝගික විශ්වාස පිළිබඳ සමීක්ෂණය: ශ්‍රී ලංකාවේ පාරිභෝගික හැඟීම නිරීක්ෂණය කිරීමේ ක්‍රමවේදය”, SLOTS වාර්තාව #2022-01. https://ihp.lk/publications/docs/SLOTSReport202201.pdf යෙන් ලබා ගත හැකිය

**සෞඛ්‍ය ප්‍රතිපත්ති ආයතනය (IHP) පිළිබඳව**

IHP යනු ශ්‍රී ලංකාවේ කොළඹ පිහිටි ස්වාධීන, පක්ෂග්‍රාහී නොවන පර්යේෂණ මධ්‍යස්ථානයකි. SLOTS හි ප්‍රධාන විමර්ශකයා වන්නේ IHP හි ආචාර්ය රවී රන්නන්-එළිය මහතා යි. ඔහු හාවඩ් විශ්ව විද්‍යාලයේ මහජන මත විමසුම් සමීක්ෂණ පිළිබඳ පුහුණුව ලබා ඇති අතර දශක තුනක් පුරා විවිධ මත විමසුම් සමීක්ෂණ සිදු කරමින් සිටියි.

**ක්‍රමවේදය**

අහඹු ජංගම දුරකථන අංක ඇමතීමෙන් සම්බන්ධ කරගත් වැඩිහිටියන්ගේ (වයස අවුරුදු 18 සහ ඊට වැඩි) නියැදියක් සහ මීට පෙර අහඹු තෝරා ගැනීමකින් බඳවා ගන්නා ලද ප්‍රතිචාර දැක්වූවන්ගේ නියැදියකට සිදු කරනු ලැබූ සම්මුඛ පරීක්ෂණ, SLOTS මඟින් ඒකාබද්ධ කරනු ලබයි. වයස, ස්ත්‍රී පුරුෂ භාවය, පළාත, අංශය, සමාජ ආර්ථික තත්ත්වය, ජනවාර්ගිකත්වය, අධ්‍යාපන මට්ටම භාවිතයෙන් ජාතික ජනගහනයට ගැළපෙන පරිදි සියලුම පාරිභෝගික විශ්වාසනීය දර්ශක ඇස්තමේන්තු නැවත සකස් කර ඇත.

**අරමුදල් සැපයීම**

නීලන් තිරුචෙල්වම් භාරය, එක්සත් රාජධානියේ සෞඛ්‍ය හා සත්කාර පර්යේෂණ සඳහා වන ජාතික ආයතනය (NIHR), ශ්‍රී ලංකාවේ ආසියා පදනම සහ අනෙකුත් අනුග්‍රාහකයින් විසින් SLOTS සඳහා අරමුදල් සපයයි. නමුත් අධ්‍යයන සැලසුම්, සහ සොයාගැනීම් විශ්ලේෂණය සහ අර්ථකථනය කිරීමේදී අනුග්‍රාහකයින් කිසිදු කාර්යභාරයක් ඉටු නොකරයි. වඩාත් සවිස්තරාත්මක දත්ත සහ ප්‍රතිඵල සඳහා උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ට IHP සම්බන්ධ කර ගත හැකිය.